ලංකාවෙ පොත්පත් ප්‍රකාශනයේ ඉතිහාස කතාව

ඉංග්‍රීසිහුද නිල පොත්පත් හා පත්‍රිකාවලට අමතරව මිෂනාරි ආගමික ප්‍රචාරයන් සඳහා අවශ්‍ය පොතපත පළ කිරීම ඔවුන්ගේ වගකීමක් ලෙසින් සලකා ක්‍රියා කළහ. මෙපරිදි නිකුත් කළ සියලුම ප්‍රකාශන වල රජයේ බලය ප්‍රකාරව ප්‍රකාශකයා වූයේ රජයේ මුද්‍රණ ශිල්පියාය.

යම්කිසි ලේඛකයෙකු විසින් ලියුලේඛනයක් මුද්‍රණද්වාරයෙන් බිහිකොට වගකීමෙන් යුතුව ප්‍රසිද්ධ කරන්නා ලප්‍රකාශකයා යනුවෙන් සරල ලෙසින් හැඳින්විය හැකිය. දහනව වැනි සිය වසෙහිදී මෙරට පොතපත පළ කිරීම සුලභවන්ම මුද්‍රණ ශිල්පියා හා පොත් වෙළෙන්දා අතර මෙන්ම පාඨකයා අතරද ප්‍රචාරණ සම්බන්ධීකරණයට ප්‍රකාශකයාගේ කාර්යභාරය අවශ්‍ය විය. ඇතැම් විට මොහු ආයෝජකයාද විය. වත්මනෙහි බොහෝ කෘතිවල සාධෝපකාරී නිර්මාතෘවරයාද වන්නේ මොහුය. අද්‍යතන ලෝකයට ප්‍රකාශකයාගේ ආගමනය මෙසේ සිදුවුද එදා සිට අද දක්වාත් මුද්‍රණ ශිල්පියා බොහෝ විට ප්‍රකාශකයාගේ භූමිකාවෙහි රැඳී සිටින බව පෙනෙන්නට තිබේ. ලන්දේසීන් විසින් මෙරට මුද්‍රණ ශිල්පය හඳුන්වා දෙමින් 1737 දී ප්‍රථම සිංහල පොත හැටියට ලංකා යාච්ඥා පොත ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අමතර වශයෙන් ඔවුන්ගේ නිල නිවේදන මෙන්ම ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරය සඳහා වුපොතපත ද මුද්‍රණය කළහ. ලන්දේසි ආණ්ඩුකාරවරයාගේ සුපරිකෂාව යටතේ මුද්‍රණය වුමේවායේ ප්‍රකාශන බලතල අනුමතික මණ්ඩලයකට පැවරිණ.

ලන්දේසීන් ගෙන් පසු 1796 දී මෙරට අත්පත් කරගත් ඉංග්‍රීසිහුලන්දේසීන්ගේ මුද්‍රණාලය පාදක කොටගෙන ලංකාණ්ඩුවේ මුද්‍රණාලය ස්ථාපිත කළහ. එමගින් 1802 මාර්තු 15 වැනි දින ලංකාවේ ප්‍රථම නිලවාරිකය වූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය නිකුත් කළහ. සතියේ සෑම සඳුදා දිනකම බ්‍රිතාන්‍යයන්ට අයත් ප්‍රදේශවල බෙදා හැරීම සඳහා දහවල් 12 ට පෙර ප්‍රකාශයට පත් කෙරෙන බව එහි නිල නිවේදනයේ සඳහන් විය.

ඉංග්‍රීසිහුද නිල පොත්පත් හා පත්‍රිකාවලට අමතරව මිෂනාරි ආගමික ප්‍රචාරයන් සඳහා අවශ්‍ය පොතපත පළ කිරීම ඔවුන්ගේ වගකීමක් ලෙසින් සලකා ක්‍රියා කළහ. මෙපරිදි නිකුත් කළ සියලුම ප්‍රකාශන වල රජයේ බලය ප්‍රකාරව ප්‍රකාශකයා වූයේ රජයේ මුද්‍රණ ශිල්පියාය. මේ බව හුවා දක්වමින් එවකට එම තනතුර දැරූ ෆ්‍රාන්ස් ද බ්‍රෑසින්ගේ නම කැපී පෙනෙන අයුරින් මුද්‍රණය විණ.

මුලදී පිටු 2 කට සීමා වූ ගැසට් පත්‍රය රජයේ නිල නිවේදනවලට පමණක් සීමා විය. එහෙත් කල් යත් යත් රජයේ සාමාන්‍ය දැන්වීම්, අධිකරණ නිවේදන, ප්‍රසිද්ධ වෙන්දේසි, නාවික පුවත්, මෙරට මෙන්ම විදේශීය යුද පුවත්, එංගලන්ත පාර්ලිමේන්තු වාර්තා මෙන්ම පුද්ගල පුවත්වලට අමතරව ගද්‍ය පද්‍ය රචනාවන්ද පළවන්නට වූයේය. මෙම පුවත්, අඩංගු කිරීම පිණිස ගැසට් පත්‍රයේ අතිරේක පිටුවක්ද ආරම්භ කරන ලදී.

මෙසේ එහි විෂය කෙෂ්ත්‍රය පුළුල් වුවද ඒ හැම එහි ප්‍රකාශකයාගේ හෙවත් රජයේ බලය උල්ලංඝණය නොවන අන්දමින් පළවිය යුතු විය. මීට අමතරව එවක කිසිදු පොදු ප්‍රකාශනයක් පළ වූයේ නැත.
අනතුරුව 1832 දී කෝල්බෲක් කැමරන් කොමිසම මගින් අධ්‍යාපනය පුළුල් කිරීම උදෙසා නිර්දිෂ්ඨ කළ ජන මාධ්‍ය නිදහස මෙරට ප්‍රකාශන කෙෂ්ත්‍රයේ ව්‍යාප්තියට රුකුලක් විය.

මෙම ඉඩ ප්‍රස්ථාව අති මහත් ලෙසින් වැළඳගත් එවක සිටි නිදහස් මතධාරී, සාහිත්‍යකාමියෙකු වූ විලිමෙට් හෝර්ටන් ආණ්ඩුකාරවරයා වහා ක්‍රියාත්මක විය. එවකට පළවෙමින් තිබුගැසට් පත්‍රයේ අතිරේකය අත්හිටුවමින් ඔහුරජයේ මුද්‍රණාලය මගින් 1832 දී ද කළමිබු ජර්නල් නමැති මෙරට පොදු පුවත්පත ඇරඹුවේය. එහි ප්‍රකාශනය රජයේ බලය ප්‍රකාරව සිදු කෙරෙන බව සඳහන් විය. එහෙත් පළ වී වසරක් ඉකුත් වීමට තිබියදී එංගලන්ත බලධාරීන්ගේ උදෑසනට ලක්වී එහි ප්‍රකාශනය ඔවුන්ගේ බලය ප්‍රකාරව අත්හිටුවන ලදී.

ඉන් පසු උදාවුයේ නිදහස් ජන මාධ්‍යයේ අරුණෝදයයි. පෞද්ගලික ව්‍යවසාය යටතේ 1834 පෙබරවාරි 04 වැනිදා ලද සිලෝන් ඔබ්සර්වර් ඇන්ඩ් කොමර්ෂල් ඇඩ්වර්ටයිසර්ල ඇරඹීමෙන් මෙරට පුවත්පත් ප්‍රකාශනයේ අභිවෘද්ධියකට මග පෑදිණ. එහි මුද්‍රණය ඔබ්සර්වර් මුද්‍රණාලයේ සිදු වූ අතර ප්‍රකාශකයා වූයේ ඊ. ජේ. ඩාර්ලි මහතාය. ඔහු ලංකාවේ එවකට තිබූ සුප්‍රසිද්ධ වෙළෙඳ සමාගමක් වූ්‍ර්. ජේ. ඩාර්ලි බටලර් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා විය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලය ආරම්භයේදී මිෂනාරි ව්‍යාපාරයට අතහිත දෙමින් ආගමික පොතපත ප්‍රචාරය කළද පාඩම් පොත්, ශබ්ද කෝෂ හා ටර්නර්ගේ මහාවංශ පරිවර්තනයද මුද්‍රණය කොට ප්‍රකාශ කිරීමෙහිලා උත්සුක විය. මෙහිදී ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරයට දුන් සහය අඩාල වීමේ හේතුව නිසා 1812 දී බයිබල් සමාගමත් 1815 දී වෙස්ලියානු සමාගමත් තමන්ගේම මුද්‍රණාල පිහිටුවා ගත්හ.

කල්යාමේදී ආණ්ඩුවේ මුද්‍රණාලයට සමගාමීව අනෙක් මුද්‍රණාලද්වයෙන්ද භාෂාව, සාහිත්‍යය, ඉතිහාසය, වෛද්‍ය විෂයයන්ට අදාල දුර්ලභ කෘතීන් කිහිපයක් මුද්‍රණය කොට ප්‍රකාශ කිරීමට උනන්දු වූහ.

ලන්දේසීන් ගේ අවදියේ මෙන්ම බ්‍රිතාන්‍ය පාලනයේ මුල් සමයේදී පළ කරන ලද පොත්පත් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ජෝන් චර්චොක් හා නිකොල්සන් පියතුමා විසින් සම්පාදිත 1868 දී පළ කරන ලද සිංහල, පාලි හා සංස්කෘතික පොත් පිළිබඳ ලැයිස්තුවක්ද 1846 රාජකීය ආසියාතික සමිතියේ කලාපයෙහිද සඳහන් වේ.

ලංකාවේ ඇරඹුමුල්ම සිංහල සඟරා හා පුවත්පත් පිළිබඳව යට කී ලුමුදීත සිංහල පොත්පත්ල කෘතියේ ප්‍රථම සිංහල සඟරාව ගැන මෙසේ සඳහන් වෙයි. සිංහලෙන් මුද්‍රිත ප්‍රථම සඟරාව මාසික තෑග්ග (ප්‍රමාණය ඩිමයි 12 * පිටු* 8) 1832 දී කෝට්වෙදි පළකර ඇත. එහි බොහෝ සේ ඇතුළත් වනුයේ බයිබල් කතාය. එය රොබට් ස්පෙන්සර් හාඩි පියතුමාගේ ප්‍රකාශනයක් වුඅතර බෙදා හරින ලද්දේ මිෂනාරි පාසල්වල සිසුන් අතරේ පමණි. නිකුත් කළේ සීමිත පිටපත් ප්‍රමාණයකි.

ඊළඟට හාඩි පියතුමා, විසින් 1839 දී ලංකා නිධානය සඟරාව පළ කළේය. එහි කලාප 7 ක් පළවිණි. ප්‍රමාණයෙන් ඩිමයි 12 ක් වුඑසද පිටු8 කට සීමාවිය. විවිධ විෂයයන් යටතේ ලියැවුණුලිපිද, මාසික ප්‍රවෘත්ති සාරාංශයකින්ද යුතුව පළ කළ එය 1846 දී අත්හිටුවිණ.

ඉන් පසුගුරුවරුන් පුනුණුකරන පාඩශාලාවේ ආචාර්ය එවක සිටි ප්‍රකට සිංහල උගතෙකු වුජෝන් පෙරේරා ගුරුන්නාන්සේගේ ශාස්ත්‍ර නිධානය (1846) පළවන්නට වූයේය. වැසිලියන් මිසියොනාරිස් උන්නාන්සේලා පොත් අච්චු ගසන ස්ථානය මුද්‍රණය කරවා ප්‍රකාශ කරන ලද්දේත් එතුමාගේ නමිනි. තවද සඟරා නමින් ප්‍රථම වරට හඳුන්වා දෙමින් සුප්‍රසිද්ධ පඬිවරයෙකු වුදොන් අන්ඩ්‍රියස් ද සිල්වා දේවරක්ෂිතාභිධාන රාජකීය පඬිතුමා ප්‍රකාශනය කළ යතලබ සඟරාව (1854) මුද්‍රණය වූයේ කතෝලික මුද්‍රණාලයේය.

මෙම අවදියේදී දැඩි ලෙස සිදු වූ ක්‍රිස්තියානි ආගමික ප්‍රචාරයන් මුළු රටම වෙළා ගනු ලැබුයේ අච්චු අකුරු මගිනි. ඊට ප්‍රතිප්‍රහාර දීමට මුද්‍රණ යන්ත්‍රාල නොමැතිකමින් පෙළුණු බෞද්ධයෝ ඉන් මෙලෙස නිකං බලා නොසිටියහ. උගත් බහුශ්‍රැත මහා සංඝයා වහන්සේ පෙරටුකොටගත් ඔවුහු ප්‍රසිද්ධ දේශන. වාද විවාද හා අත්අකුරෙන් ලියා බෙදාහරින ලද පත්‍රිකා මගින්ද දුර්මතවලට පහර දුන්හ. එතෙකුදු වුවත් කෂණිකව රට පුරා ප්‍රචාරය කළ හැකි මුද්‍රිත මාධ්‍ය සපයා ගැනීම සිදු කළ හැක්කේ මුද්‍රණාලයක් තමන් සතුව ඇත්නම් පමණකැයි සාක්ෂාත් කළහ.

අනතුරුව 1860 දී ගාල්ලෙන් ලංකා ලෝක නමින් මේ රටේ ප්‍රථම සිංහල පුවත්පත නිකුත් විණ. 1860 සැප්තැම්බර් 10 වැනි දින නිකුත් කර ශේෂවී පවතින මෙහි හයවන කලාපයේ දොඩන්දූවේ ශෛලබිම්බාරාම පුස්තකාලයේ තැන්පත්වී තිබේ. එය මුද්‍රණ විලාසම අනුව සඳහන් වනුයේ ගාල්ලේ කොටුවේ චර්චා වීදියේ අංක 2 දරණ ස්ථානයේ ලංකා ලෝක කන්තෝරුවේ ඩී. ඩබ්ලිව්. කේ. ජයවර්ධන මැදිතුමා වෙනුවෙන් මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලද බවයි.
ලංකා ලෝකය කලාප 6 ක් පමණ මුද්‍රණය කොට අස්තංගත විය.

ඊට පසු ගාලු පෙදෙසේ බොදු පුනරුදයේ සෙන්පතියෙකු වූ ප්‍රජ්ඤ පාද මුලන්ගම සිරි සුමනතිස්ස නාහිමිපාණන් වහන්සේගේ බලවත් උත්සාහයෙන් 1862 දී කතළුවේ ලංරකාසකාර මුද්‍රණාලය පිහිටුවීමට සියලු රජතුමාගෙන් පවා ආධාර ලැබී ඇත.ලංකා ලෝකය පත්‍රය දෙවන වරට ඇරඹූ එම මුද්‍රණාලය පිහිටුවා වසර 4 ක් ඇතුළත බුද්ධශාසනෝපකාර වශයෙන් කරන ලද පොත්ද ඇතුළු ශාස්ත්‍රීය පොත් 4655 ක් පමණද ආගම දහම සම්බන්ධ කළ යුතු පනාදීන් දහසක් පමණද අච්චු ගස්වා පළ කළ බව එම මුද්‍රණාලය පිළිබඳ වාර්තාවක සඳහන් කොට ඇත.

මෙම මුද්‍රණාලයේ මුද්‍රා පිටපත හැම ප්‍රකාශයකම මුද්‍රණාලයේ නමට අමතරව පොත්වල කර්තෘන් විසින් ඒවා ප්‍රකාශ කොට ප්‍රසිද්ධ කරන ලද බවද සඳහන් වේ. ප්‍රථම වරට මේ රටේ කර්තෘ ප්‍රකාශකවරු බිහිවුප්‍රථම අවස්ථාව මෙය විය හැකිය.

දකුණු ලක පැතිර ගිය බොදු පුනරුදයේ බිප් කොළඹ නගරයේද රෝපණය වීම හටගත්තේ ප්‍රජ්ඤාපාද වලානේ ශ්‍රී සිද්ධාර්ථ මාහිමියන් රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන අරඹා ඒ මගින් ඇතිවුධර්ම ශාස්ත්‍රෝත්සයේ හේතුවෙනි. මෙහි වැඩ විසුහික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ධම්මාලෝක මාහිමිවරු හා එහි ගුරු දේවයෙකු වුදොන් අන්ඩ්‍රියස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා ආදීන්ගේද උදෙග්‍යය නිසා ? නැගි භාෂා ශාස්ත්‍ර හා ආගමික ප්‍රබෝධ කොළඹ නගරය කේන්ද්‍ර කොටගෙන 1862 සැප්තැම්බර් 11 වැනි දින ලක්මිණි පහණ පත්‍රය ඇරඹීමට හේතු විය. තවද 1863 දී කොළඹ පදිංචි සිංහල බෞද්ධයන් කිහිප දෙනෙකු එකතු වී ලංකාහිනවශිශ්‍රෙෂ්ඨ මුද්‍රණාලය පිහිටුවා ගත්හ.

ලංකාහිනවශිශ්‍රෙෂ්ඨ මුද්‍රණාලයේ අධිපති වූයේ දේවරකමිත පඬිතුමාගේ පුත් රොබට් බටුවන්තුඩාවේ මහතාය. එවකට පැවැති සුප්‍රසිද්ධ පානදුරාවාදය (1872) මෙන්ම විද්‍යෝදය (1873) හා විද්‍යාලංකාර (1875) පිරිවෙන් පිහිටුවීමෙන්ද උදාවුධර්ම ශාස්ත්‍ර ප්‍රබෝදයෙන් ප්‍රමුදිත වුපොත්පත් හා ග්‍රන්ථ ප්‍රකාශන කෙෂ්ත්‍රයට මෙම මුද්‍රණාලය මගින් නව පණක් ගෙන දුන්නේය. ඊට අමතර වශයෙන් 1864 දී ලක්රිවිකිරණ පත්‍රය හා මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන්වහන්සේගේ කොටහේනේ පිහිටවූ සර්වඥ ශාසනාභිවෘද්ධි සමාගමේ මුද්‍රණාලයද ආරම්භවීම නිසා කොළඹ නගරයේ ධර්ම ශාස්ත්‍රීය පොත්පත් ප්‍රකාශනයේ වර්ධනයට රුකුලක් විය.

මේ අවදියේ පළවුපොත්පත් බොහොමයක ප්‍රකාශකගේ නැත ගත්තේ සමිති සමාගම් හා ඒවායේ නිල තල දැරූ පුද්ගලයෙන් හෝ ආයෝජකයන්ය. මෙම අවදියේදී ධර්ම, ශාස්ත්‍රීය හා ඓතිහාසික පොත් ප්‍රකාශන ආදියෙන් ඉදිරියට ගිය ස්වදේශීය පොත් ප්‍රකාශනය ප්‍රකාශන සමාගම් හා පොත් සාප්පු බිහි කිරීමෙහි ලා සමත් විය. එහිදා අගනුවර ප්‍රධාන කොට සෙසු ප්‍රදේශ වල ද එම ප්‍රවණතාව පැතිර යන්නට විය. මීට අමතර වශයෙන් පොත් මිටි හා පොත් පෙට්ටි කර තබාගෙන ගමින් ගමට යන ජංගම පොත් වෙළෙඳුන්ද බිහිවිය. මේ නිසා පොත්ගුල් සංකල්පයද පල දැරිණ.

මෙහිදී දකුණේ බොදු පුනරුදය කොළඹට ගෙන ඊටට පුරෝගාමී වුදොන් පිලිප් ද සිල්වා අපපා අප්පුහාමි විධිමත් පුරෝගාමී පොත් ප්‍රකාශකයෙකු ලෙසින් පෙරට පැමිණියේ අපපා පංචාංගලිත හා බිත්ති ලිතේ අනුහසිනි. ලංකාවේ ආදිතම ස්වදේශීය පොත් ප්‍රකාශන සමාගමක් වූ අපපා අප්පුහාමි සහ සමාගම 1866 සැප්තැම්බර් 14 වැනිදා ලක්රිවිකිරණ පත්‍රයේ පළකළ දැන්වීමක් මෙසේ සඳහන් වේ. "ලංකාවේ ප්‍රධාන ප්‍රයෝජනවත් සළු පාලි සංස්කෘත පොත්පත් හා වෛද්‍ය ශාස්ත්‍ර නාකෂත්‍ර ආදියෙහි පොත්ද අච්චුගස්වා ප්‍රසිද්ධ කරන සමාගමක් දැනට කොළඹ සෑදී පොත්පත් අච්චුගැස්වීම පටන්ගෙන තිබෙයි. මෙම සමාගම වෙනුවෙන් ප්‍රසිද්ධ කරනුලබන්නා වූ පොත්පත් සුද්ධ කර දීමේ ආදී උපකාර කිරීමට ලංකාවේ ප්‍රසිද්ධ සමර්ථ පණ්ඩිතවරුන්ගෙන් දෙන්නෙක් තුන් දෙනෙක් සිටිති. යම් යම් සමර්ථයන් විසින් අමුතුවෙන් සාදනු ලබන්නා වූ ප්‍රයෝජනවත් පොත්පත් ලැබුණොත් මෙම සමාගම විසින් සෑහෙන මිලදී නාරගෙන ප්‍රසිද්ධ කිරීමට කැමැති බව දැනගත යුතුය."

මෙහිදී අපපා අප්පුහාමි සහ සමාගම ස්වදේශීය පොත් ප්‍රකාශනය සඳහා ද කොතරම් කැපවුයේදැයි මෙම දැන්වීමෙන් මොනවට හෙළිවෙයි. 19 වැනි සියවසේ බොදු පුනරුදයේ පුරෝගාමී මෙම දෑ නිතකාමී බොදු නායකයා ගැන 19 වන සියවසේ ශ්‍රී ලංකාවේ ජාතික ආගමික අරගල කෘතියෙන් විද්වත් සිරිතිලකසිරි මහතා මෙසේ අවධාරණය කරයි.

"බෞද්ධ ප්‍රබෝධය මුල්කරගෙ ඇති වූ ජාතික ව්‍යාපාරය සඳහා කොළඹ නගරය කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමට මුලිකව කටයුතු කළ තැනැත්තා නම් දොන් පිලිප් ද සිල්වා අපපා අප්පුහාමිය. ජාතික වීරයන් ගැන මහ ලොකුවට කථා කරන අපි අද ඔහුසහමුලින්ම අමතක කොට සිටිමු. ඔහුසිහිපත් වන්නට අවුරුදු පතා නිකුත්වන අපපා පංචාංගලිත හා අපපා බිත්ති ලිතේ ඇති බව සැබවි. එහෙත් මේ ලිත් අපේ වැඩිහිටි පරපුරේ සමහරුන්ට මිස සෙසුඅයට අපපා අප්පුහාමි සිහිපත්වීමට හේතු නොවනුඇත. ඔවුන්ද පිලිප් ද සිල්වා, අපපා අප්පුහාමි ගැන සිතන්නේ දක්ෂ නකැත් කාරයකු සේ පමණකැයි සිතමි...."

"දොන් පිලිප්ල ද සිල්වා අපපා අප්පුහාමි එදා සිටි කීර්තිමත් ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයා පමණක් නොවේ, දක්ෂ වෛද්‍යවරයෙකි. ඒ තරමට ඔහුජාතික ආගමික ව්‍යාපාරයන්හිද, ශාස්ත්‍රීය කටයුතුවලද මුල්තැන ගත්තේය. එදා කොළඹ මෙන්ම ඉන් පිටතත් සිටි සිංහල ජනතාව විසින් අපපා අප්පුහාමි සලකනුලැබුවේ ජන නායකයෙකු ලෙසිනි..."

නුවරඑළියේ හේමපාල



"සේවා"

2009 අප්‍රේල් 04 ට

වසර 10
සම්පූර්ණ කරයි

අපේ සුබ පැතුම්